63441

AL/2021(2022)/32/S-I

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021 (2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021 (2022)

ව්‍යාපාර අධ්‍යයනය I
வணிகக் கல்வி I
Business Studies I

32 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

- ※ **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
- ※ **විභාග අංකය**, ඉහළින් ඇති කොටුවේ පැහැදිලිව සටහන් කරන්න.
- ※ ප්‍රශ්න අංක **1** සිට **30** තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා, එහි අංකය ප්‍රශ්නය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.
- ※ ප්‍රශ්න අංක **31** සිට **50** තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉරි මත ලියන්න.
- ※ සෑම ප්‍රශ්නයකට ම ලකුණු **දෙක** බැගින් හිමි වේ.

විභාග අංකය : ........................................

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| I පත්‍රය සඳහා | |
|---|---|
| ප්‍රශ්න අංක | ලකුණු |
| 01 - 30 | |
| 31 - 50 | |
| එකතුව | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අති. ප්‍රධාන පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |

**1.** සෑම භාණ්ඩයක් හා සේවාවක් මඟින් ම පාරිභෝගික
(1) අවශ්‍යතා ඉටු කරයි.
(2) වුවමනා ඉටු කරයි.
(3) අවශ්‍යතා හා වුවමනා ඉටු කරයි.
(4) අවශ්‍යතා ඉටු කිරීමට හිඟ සම්පත් භාවිත කරයි.
(5) වුවමනා ඉටු කිරීමට හිඟ සම්පත් භාවිත කරයි. (......)

**2.** ප්‍රාථමික නිෂ්පාදන යනු,
(1) අතුරු නිෂ්පාදන වේ.
(2) සකස් නොකළ අමුද්‍රව්‍ය වේ.
(3) උපකාරක සේවා වේ.
(4) අර්ධ නිමි භාණ්ඩ වේ.
(5) නිමි භාණ්ඩ වේ. (......)

**3.** නිෂ්පාදනයක් සඳහා 'එකතු කළ අගය' යනු,
(1) අමුද්‍රව්‍ය පිරිවැයයි.
(2) නිෂ්පාදන පිරිවැයයි.
(3) නිෂ්පාදන පිරිවැය සහ ලාභයේ එකතුවයි.
(4) නිෂ්පාදන පිරිවැය සහ විකුණුම් මිල අතර වෙනසයි.
(5) සෑම නිෂ්පාදන අදියරක දී ම වැඩිවන වටිනාකමයි. (......)

**4.** සංවිධානයක යෙදවුම්-නිමැවුම් ක්‍රියාවලිය පිළිබිඹු කරනු ලබන්නේ,
(1) මූල්‍ය ක්‍රියාවලිය මඟිනි.
(2) නිෂ්පාදන ක්‍රියාවලිය මඟිනි.
(3) මිල දී ගැනීම් ක්‍රියාවලිය මඟිනි.
(4) අලෙවිකරණ ක්‍රියාවලිය මඟිනි.
(5) තොරතුරු කළමනාකරණ ක්‍රියාවලිය මඟිනි. (......)

**5.** ව්‍යාපාරයක ආසන්න පරිසර බලවේගයක් වන්නේ,
(1) පාරිභෝගිකයින් ය.
(2) කළමනාකරුවන් ය.
(3) සේවකයින් ය.
(4) සංවිධාන ව්‍යුහයන් ය.
(5) අයිතිකරුවන් ය. (......)

[දෙවැනි පිටුව බලන්න.

6. ප්‍රජා සත්කාර සේවාවේ නිරත වීම මගින් ව්‍යාපාර සමාජීය වගකීම ඉටු කරනු ලබන්නේ,
(1) රජය වෙනුවෙනි. (2) සමාජය වෙනුවෙනි. (3) රට වෙනුවෙනි.
(4) ගනුදෙනුකරුවන් වෙනුවෙනි. (5) අයිතිකරුවන් වෙනුවෙනි. (......)

7. සුපිරි වෙළෙඳසැලකින් භාණ්ඩ මිලට ගැනීමේ දී පාරිභෝගිකයාට,
(1) සේවක අවධානය සෘජුව ලබාගත හැකි ය.
(2) ඕනෑම සේවාවක් ලබාගත හැකි ය.
(3) ණයට භාණ්ඩ මිල දී ගත හැකි ය.
(4) නිෂ්පාදන පරාසයකින් තෝරීම් කළ හැකි ය.
(5) භාණ්ඩ මිල ගණන් කේවල් කිරීමට හැකි ය. (......)

8. අපද්‍රව්‍ය කළමනාකරණයේ 4R සංකල්ප සහ ඒවාට අදාළ උදාහරණ පහත වගුවේ දක්වා ඇත.

| සංකල්ප | උදාහරණ |
|---|---|
| (i) ප්‍රතිචක්‍රීයකරණය | A - මුද්‍රණය කිරීම වෙනුවට ලිපි පරිගණක තිරයේ කියවීම |
| (ii) නැවත ස්ථාපිත කිරීම | B - ඉවතලන කඩදාසි, කෙටි සටහන් ලිවීම සඳහා යොදා ගැනීම |
| (iii) භාවිතය අඩු කිරීම | C - භාවිතයෙන් ඉවත් කළ ජංගම දුරකථන කොටස් යොදාගෙන ඔලිම්පික් පදක්කම් නිපදවීම |
| (iv) නැවත භාවිත කිරීම | D - පලතුරු හා එළවළු අපද්‍රව්‍යවලින් කාබනික පොහොර නිපදවීම |

ඉහත දී ඇති සංකල්ප අනුපිළිවෙළ අනුව, උදාහරණ නිවැරදිව ගළපා ඇති වරණය කුමක් ද?
(1) A, D, B, C (2) B, C, A, D (3) B, D, C, A
(4) D, A, C, B (5) D, C, A, B (......)

9. ව්‍යාපාරික අරමුණු සහ ඒවා ඉටුකර ගැනීමට යොදා ගන්නා ලද ක්‍රියාකාරකම් පහත වගුවේ දක්වා ඇත.

| අරමුණු | ක්‍රියාකාරකම් |
|---|---|
| (i) විකුණුම් ආදායම වර්ධනය | A - දෙපාර්තමේන්තු අතර අන්තර් සම්බන්ධතාව වැඩි කිරීම |
| (ii) මූල්‍ය ප්‍රවාහ වර්ධනය | B - භාණ්ඩවල ගුණත්වය වැඩි කිරීම |
| (iii) පාරිභෝගික තෘප්තිය වර්ධනය | C - රක්ෂණ පහසුකම් ලබාදීම |
| (iv) සේවක කුසලතා වර්ධනය | D - වෙළඳ වට්ටම් ලබාදීම |
| (v) සේවක සුභසාධනය වර්ධනය | E - ණයගැති පිරිවැටුම් කාලය අඩු කිරීම |

ඉහත දී ඇති අරමුණු අනුපිළිවෙළ අනුව, ඊට ගැළපෙන ක්‍රියාකාරකම් නිවැරදිව ගළපා ඇති වරණය කුමක් ද?
(1) A, D, E, C, B (2) B, E, C, A, D (3) B, C, D, E, A
(4) D, B, A, E, C (5) D, E, B, A, C (......)

10. ව්‍යාපාරයක ස්ථාවර වත්කමක් විකිණීමේ දී එම වත්කමේ පිරිවැයට වඩා වැඩියෙන් ලැබෙන ප්‍රතිෂ්ඨාව බදු ගණනය කිරීමේ දී සැලකෙන්නේ,
(1) ලාභය ලෙසිනි. (2) ප්‍රාග්ධන ලාභය ලෙසිනි.
(3) ආදායම ලෙසිනි. (4) ප්‍රාග්ධන සංචිතය ලෙසිනි.
(5) අයභාර ලාභය ලෙසිනි. (......)

11. හවුල් ව්‍යාපාර ආඥා පනතේ 24 වන වගන්තියෙහි සඳහන් වන්නේ,
(1) ප්‍රාග්ධනය වෙනුවෙන් පොලියක් හවුල්කරුවන්ට ගෙවිය යුතු ය.
(2) හවුල්කරුවන්ගේ අමතර ප්‍රාග්ධන ආයෝජනයට 5%ක වාර්ෂික පොලියක් හිමි ය.
(3) හවුල්කරුවන්ගේ සේවය වෙනුවෙන් වේතනයක් ගෙවිය යුතු ය.
(4) එක් හවුල්කරුවකුගේ කැමැත්ත මත නව හවුල්කරුවෙකු බඳවාගත හැකි ය.
(5) ලාභ හෝ අලාභ හවුල්කරුවන් යෙදූ ප්‍රාග්ධන අනුපාතය අනුව බෙදාගත යුතු ය. (......)

**12.** සාමාන්‍ය කොටස් හිමියන් සමඟ සැසඳීමේ දී වරණීය කොටස් හිමියන්ට,

| | ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය | විසුරුවා හැරීමේ දී ආයෝජන මුදල් ලබාගැනීමේ ප්‍රමුඛතාවය | ලාභාංශ සඳහා ප්‍රමුඛතාවය |
|---|---|---|---|
| (1) | හිමි වේ. | හිමි වේ. | හිමි වේ. |
| (2) | හිමි වේ. | හිමි වේ. | හිමි නොවේ. |
| (3) | හිමි නොවේ. | හිමි නොවේ. | හිමි නොවේ. |
| (4) | හිමි නොවේ. | හිමි වේ. | හිමි වේ. |
| (5) | හිමි නොවේ. | හිමි නොවේ. | හිමි වේ. |

(......)

**13.** ව්‍යවසායකයින් සෑම විට ම,
(1) මූල්‍ය ප්‍රතිලාභ පමණක් අපේක්ෂා කරයි.
(2) ඉහළ සමාජ මට්ටමක් අපේක්ෂා කරයි.
(3) නව ව්‍යාපාර සඳහා සම්පත් ආයෝජන කරයි.
(4) පවත්නා ව්‍යාපාරයෙහි ඒ අයුරෙන් ම තියෙලෙයි.
(5) කළමනාකරුවන් හට සියලු ම තීරණ ගැනීමට ඉඩ සලසයි. (......)

**14.** මාර්ගගත ගනුදෙනු සිදු වන්නේ,
(1) ආයතනික මැදිහත්වීමකින් තොරව ය.
(2) මූල්‍යමය මැදිහත්වීමකින් තොරව ය.
(3) විද්‍යුත් උපකරණයක මැදිහත්වීමකින් තොරව ය.
(4) සැපයුම්කරුවකුගේ මැදිහත්වීමකින් තොරව ය.
(5) අතරමැදියකුගේ මැදිහත්වීමකින් තොරව ය. (......)

**15.** ජීවිත රක්ෂණය,
(1) ඉතිරි කිරීමකට සමාන වේ.
(2) හානිපූර්ණ මූලධර්මය මත පදනම් වේ.
(3) වෙනත් අයකුට පැවරිය හැකි වේ.
(4) නිශ්චිත අවදානමක් හා නොබැඳේ.
(5) වාර්ෂිකව අලුත් කළ යුතු වේ. (......)

**16.** සේවක අභිප්‍රේරණ ක්‍රම කිහිපයක් පහත දැක්වේ.

A – උසස්වීම්
B – කොටස් හිමිකාරිත්වය
C – සම්මාන
D – ණය පහසුකම්
E – සහන මිලට නිෂ්පාදිත සැපයීම
F – පුහුණුව
G – ප්‍රසාද දීමනා
H – කාර්යසාධන ඇගයීම
I – දීමනා

ඉහත දැ අතුරෙන් මූල්‍ය අභිප්‍රේරණ ක්‍රම පමණක් ඇතුළත් වරණය කුමක් ද?
(1) A, C, E, F, G (2) B, D, E, G, I (3) B, E, G, H, I
(4) D, E, F, G, H (5) D, E, G, H, I (......)

**17.** පණිවුඩ හා සන්නිවේදන ක්‍රම කිහිපයක් පහත වගුවේ දක්වා ඇත.

| පණිවුඩ | සන්නිවේදන ක්‍රම |
|---|---|
| (i) විභාගය සමත් වූ සිසුන්ගේ නාම ලේඛනය පාසලේ ප්‍රසිද්ධ කිරීම | A - ලිපිය |
| (ii) විදේශ සැපයුම්කරුට හදිසි ඇණවුමක් වාචිකව සන්නිවේදනය කිරීම | B - විද්‍යුත් තැපැල |
| (iii) සේවක පත්වීමක් තැපැල් මගින් දැනුම් දීම | C - දැන්වීම් පුවරුව |
| (iv) ආයතනයකට පැමිණිය යුතු මාර්ගය පිළිබඳව සවිස්තරාත්මක සිතියමක් කඩිනමින් යැවීම | D - සම්මන්ත්‍රණය |
| (v) රටේ ආර්ථික තත්වය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම | E - දුරකථන ඇමතුම |

ඉහත දී ඇති පණිවුඩ අනුපිළිවෙළ අනුව, ඊට ගැළපෙන සන්නිවේදන ක්‍රම නිවැරදිව ගළපා ඇති වරණය කුමක් ද?
(1) B, C, A, E, D (2) B, C, E, D, A (3) C, B, D, A, E
(4) C, E, A, B, D (5) E, B, C, A, D (......)



PaperKokka.lk

**18.** ප්‍රවාහන හා සැපයුම් සේවා පද්ධතියක් සතු ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

A – භාණ්ඩ ඇණවුම් කිරීම
B – තොග ලැබීම
C – ගනුදෙනුකරුවන් සමඟ සම්බන්ධ වීම
D – විකුණුම් ප්‍රවර්ධනය කිරීම
E – නිකුත් කිරීම සඳහා භාණ්ඩ යළි ලබා ගැනීම
F – ගුණත්වය තහවුරු කර ගැනීම
G – භාණ්ඩ පරීක්ෂා කිරීම
H – නිවැරදි බව තහවුරු කර ගැනීම
I – ඉල්ලුම සහ සැපයුම අතර සමතුලිතතාවය පවත්වා ගැනීම
J – පර්යේෂණ හා සංවර්ධන කටයුතුවල නියුක්ත වීම

ඉහත දැ අතුරෙන් ගබඩාකරණයට අයත් ලක්ෂණ පමණක් ඇතුළත් වරණය කුමක් ද?

(1) A, B, C, D, I (2) B, C, H, I, J (3) B, E, F, G, H
(4) D, G, E, F, J (5) F, G, H, I, J (……)

**19.** පහත වගුවේ නිෂ්පාදන සහ බෙදාහැරීමේ මාර්ග කිහිපයක් දක්වා ඇත.

| නිෂ්පාදන | බෙදාහැරීමේ මාර්ග |
|---|---|
| (i) නුවරඑළියේ එළවළු | A- නිෂ්පාදකයා → සිල්ලර වෙළෙන්දා → පාරිභෝගිකයා |
| (ii) ආනයනික කිරිපිටි | B- නිෂ්පාදකයා → තොග වෙළෙන්දා → සිල්ලර වෙළෙන්දා → පාරිභෝගිකයා |
| (iii) මංගල කේක් | C- නිෂ්පාදකයා → පාරිභෝගිකයා |
| (iv) කුඩා පරිමාණ ගෙවතු වගා පලතුරු | D- නිෂ්පාදකයා → නියෝජිතයා → තොග වෙළෙන්දා → සිල්ලර වෙළෙන්දා → පාරිභෝගිකයා |

ඉහත දී ඇති නිෂ්පාදන අනුපිළිවෙළ අනුව ඊට අදාළ බෙදාහැරීමේ මාර්ග නිවැරදිව ගළපා ඇති වරණය කුමක් ද?

(1) A, C, B, D (2) A, D, C, B (3) B, C, A, D
(4) B, D, C, A (5) C, B, D, A (……)

**20.** මානව කුසලතා සහිත කළමනාකරුවන්,

(1) සේවකයින්ගේ අවශ්‍යතාවලට සංවේදී වෙයි.
(2) සේවකයින්ට සෑම විට ම නායකත්වය ලබාදෙයි.
(3) සේවක කුසලතා පමණක් අගය කරනු ලබයි.
(4) ඉහළ කළමනාකාරිත්වයට පමණක් වැදගත් වෙයි.
(5) මධ්‍ය කළමනාකරණයට පමණක් වැදගත් වෙයි. (……)

**21.** ව්‍යාපාරික දැක්ම,

(1) නිශ්චිත අරමුණු ළඟා කර ගැනීමට සේවකයින්ට බලපෑම් කිරීමේ හැකියාව පෙන්වයි.
(2) ව්‍යාපාරය ගමන් කළ යුතු දිශාව සහ එහි සමස්ත කාර්ය සම්පිණ්ඩනය කර පෙන්වයි.
(3) කළමනාකරුවන්ගේ අරමුණු සේවකයින් සමඟ බෙදාගැනීමට සහ ඔවුන්ව අභිප්‍රේරණයට මගපෙන්වයි.
(4) නම්‍යශීලී, අනුවර්තනය විය හැකි සහ කාර්යක්ෂම ව්‍යාපාරයක් බව පෙන්වයි.
(5) ගැටලු විසඳීම සඳහා සුදුසු උපායමාර්ග හඳුනාගැනීමට ඇති හැකියාව පෙන්වයි. (……)

**22.** සේවා සැපයීමේ ආයතනයක්, නිෂ්පාදන ආයතනයකින් වෙනස් වන්නේ,

(1) ශ්‍රම පිරිවැය මත ය. (2) ද්‍රව්‍ය පිරිවැය මත ය.
(3) ප්‍රාග්ධන පිරිවැය මත ය. (4) සෘජු පාරිභෝගික සම්බන්ධතා මත ය.
(5) නිෂ්පාදනවල ගුණත්වය මත ය. (……)

**23.** ප්‍රකාශය **A** : 'තත්ත්ව පාලනය' යනු නිෂ්පාදනයේ කිසිදු දෝෂයක් නොමැති බව තහවුරු කර ගැනීම සඳහා නිෂ්පාදන පරීක්ෂා කිරීමේ ක්‍රියාවලියයි.

ප්‍රකාශය **B** : තත්ත්ව පාලනය තුළින් නිෂ්පාදනයේ කිසිදු දෝෂයක් සිදු නොවන හෙයින් සෑම නිෂ්පාදන ඒකකයක් ම උසස් තත්ත්වයේ පවතියි.

ඉහත ප්‍රකාශ දෙක අතුරෙන්,

(1) **A** සත්‍ය වන අතර **B** අසත්‍ය වේ.
(2) **A** අසත්‍ය වන අතර **B** සත්‍ය වේ.
(3) **A** සහ **B** දෙකම අසත්‍ය වේ.
(4) **A** සහ **B** සත්‍ය වන අතර **B** මගින් **A** පැහැදිලි කෙරේ.
(5) **A** සහ **B** සත්‍ය වන අතර **B** මගින් **A** පැහැදිලි නොකෙරේ. (……)



PaperKokka.lk

**24.** නිෂ්පාදන ආයතනයක වාර්ෂික ස්ථාවර පිරිවැය රුපියල් 92 000ක් වන අතර ඒකකයක අමුද්‍රව්‍ය හා ශ්‍රම පිරිවැය රුපියල් 5කි. ඒකකයක විකුණුම් මිල රුපියල් 9ක් නම්, ඒකක 25 000ක් නිපදවීමෙන් ලැබෙන ලාභය,

(1) රු. 8 000 කි. (2) රු. 33 000 කි. (3) රු. 125 000 කි.
(4) රු. 133 000 කි. (5) රු. 225 000 කි. (......)

**25.** ව්‍යාපාරයකට තම අලෙවිය වැඩි කිරීම සඳහා යොදාගත හැකි ක්‍රියාමාර්ග කිහිපයක් පහත වේ.

A – අනුග්‍රාහකත්වය ලබාදීම
B – කාර්යක්ෂමතා වර්ධනය
C – සාම්පල් බෙදාදීම
D – මිල අඩු කිරීම
E – ලෝයල්ටි පොයින්ට්ස් (Loyalty Points) ලබාදීම
F – ප්‍රචාරණය
G – නොමිලේ බෙදාහැරීම
H – කූපන් ලබාදීම

ඉහත දැ අතුරෙන්, විකුණුම් ප්‍රවර්ධනයට අදාළ ක්‍රියාමාර්ග පමණක් ඇතුළත් වරණය කුමක් ද?

(1) A, B, E, F, G (2) A, D, E, G, H (3) B, D, E, G, F
(4) C, D, E, G, H (5) C, E, F, G, H (......)

**26.** ව්‍යාපාරයක ද්‍රවශීලතා අනුපාතය 2019 වර්ෂයේ දී 3:1ක් සහ 2020 වර්ෂයේ දී 1:1ක් විය. එමගින් පෙන්නුම් කරන්නේ,

ප්‍රකාශය **A** : ද්‍රවශීලතාව වර්ධනය වී ඇති බව ය.
ප්‍රකාශය **B** : කෙටිකාලීන ණය පහසුවෙන් ගෙවිය හැකි බව ය.

ඉහත ප්‍රකාශ දෙක අතුරෙන්,

(1) **A** සත්‍ය වන අතර **B** අසත්‍ය වේ.
(2) **A** අසත්‍ය වන අතර **B** සත්‍ය වේ.
(3) **A** සහ **B** යන දෙකම අසත්‍ය වේ.
(4) **A** සහ **B** සත්‍ය වන අතර **B** මගින් **A** පැහැදිලි කෙරේ.
(5) **A** සහ **B** සත්‍ය වන අතර **B** මගින් **A** පැහැදිලි නොකෙරේ. (......)

**27.** පහත දැ අතුරෙන්, මානව සම්පත් කළමනාකරණයට අදාළ වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) තාක්ෂණික සේවක පුහුණුව අනුස්ථාපනය වේ.
(2) සේවක චලනය සේවක උසස්වීම් වේ.
(3) සේවක වැඩ හා ප්‍රතිඵල මැනීම කාර්යඵල ඇගයීම වේ.
(4) සේවකයින් සඳහා වූ පුහුණුව රැකියාස්ථ පුහුණුව වේ.
(5) රැකියා කාර්යඵල ඉහළ නංවාලීමට සිදු කරන පුහුණුව සේවක සංවර්ධනය වේ. (......)

**28.** පහත දැ අතුරෙන්, විශේෂිත මූල්‍ය ආයතන කාණ්ඩයට අයත් **නොවන්නේ** කුමක් ද?

(1) ඒකක භාර (2) කොටස් තැරැව්කරුවන්
(3) ව්‍යවසායක ප්‍රාග්ධන සමාගම් (4) ප්‍රාථමික අලෙවිකරුවන්
(5) රක්ෂණ සමාගම් (......)

**29.** ව්‍යාපාරයක දත්ත හා තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

A - කාලසටහන්
B - ඒකකයක බර
C - ශිෂ්‍ය වාර්තා පොත්
D - භාණ්ඩ මිල
E - ගෙවීම් පත්‍රිකා
F - විකුණන ලද ඒකක ප්‍රමාණය
G - සේවක නම්
H - මුදල් ලදුපත්
I - බදු කේත

ඉහත දැ අතුරෙන්, දත්ත පමණක් ඇතුළත් වරණය කුමක් ද?

(1) A, C, F, G, H (2) B, D, F, G, I (3) B, D, E, G, I
(4) C, D, E, G, H (5) C, E, F, H, I (......)

**30.** බිස්කට් නිෂ්පාදන ආයතනයක ස්ථාවර පිරිවැය රු. 2 000ක් වේ. විචල්‍ය ශ්‍රම පිරිවැය ඒකකයකට රු. 5කි. ඒකක 1 000ක් නිපදවීමේ දී සාමාන්‍ය පිරිවැය වන්නේ,

(1) රු. 2 කි. (2) රු. 3.50 කි. (3) රු. 7 කි. (4) රු. 10 කි. (5) රු. 12 කි. (......)



PaperKokka.lk

- අංක **31** සිට **40** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී **සුදුසු වචනය/වචන** යොදා හිස්තැන් පුරවන්න.

**31.** (අ) භෞතික පැවැත්මේ පදනම මත පරිගණකය .................... භාණ්ඩයකට උදාහරණයක් ලෙස ද පරිගණක මෘදුකාංග .................... භාණ්ඩයකට උදාහරණයක් ද වේ.

(ආ) අන්තර්ජාලය මඟින් සිදුවන සියලු ම ව්‍යාපාර ක්‍රියාකාරකම් විද්‍යුත් ........................ ලෙස හඳුන්වන අතර විද්‍යුත් ........................ එහි උප කොටසකි.

**32.** (අ) ඉලක්ක වෙළෙඳපොළ කොටස්වලට වෙන්කිරීමේ ක්‍රියාවලිය වෙළෙඳපොළ ........................... ලෙස ද පාරිභෝගිකයාගේ මනසෙහි සන්නමක් සඳහා ධනාත්මක ආකල්පයක් ඇති කිරීම වෙළෙඳපොළ ............................. ලෙස ද හැඳින්විය හැක.

(ආ) වෙළෙඳුන් විසින් නිර්මාණය කරනුයේ ............................. සන්නම වන අතර, ජාතික සන්නම නිර්මාණය කරනුයේ ................................ විසින් ය.

**33.** (අ) දන්තාලේප ටියුබය ........................ ඇසුරුමක් වන අතර, එය බහාලන පෙට්ටිය ...................... ඇසුරුමකි.

(ආ) සාමාන්‍ය කොටස් ........................ ප්‍රාග්ධනයට ද, වරණීය කොටස් ........................ ප්‍රාග්ධනයට ද ඇතුළත් වේ.

**34.** පහත දක්වා ඇති උදාහරණවලට අදාළව මුදලේ කාර්යයන් දක්වන්න.

| උදාහරණ | කාර්යය |
|---|---|
| 1. ඔරලෝසුවක් රු. 8 000කට මිල දී ගැනීම | 1. ........................................ |
| 2. රු. 25 000ක් ඉතිරි කිරීම | 2. ........................................ |
| 3. ණයට ගත් භාණ්ඩ සඳහා මුදල් මාස 6 කට පසු ගෙවීම | 3. ........................................ |
| 4. ජංගම දුරකථනයක් රු. 30 000කට මිල කිරීම | 4. ........................................ |

**35.** (අ) ගබඩා රහිත .......................... වෙළෙඳාම යනු .......................... වෙළෙඳසැලක් නොමැතිව සිදු කරන වෙළෙඳාමකි.

(ආ) B2G යනු ...................... විසින් ............................. ට අන්තර්ජාලය හරහා භාණ්ඩ, සේවා හා තොරතුරු අලෙවි කිරීමේ ව්‍යාපාර ආකෘතියකි.

**36.** (අ) ශ්‍රී ලංකා මහ බැංකුවෙහි නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝව, නිත්‍ය .......................... පහසුකම් අනුපාතය හා නිත්‍ය ...................... පහසුකම් අනුපාතයෙන් සමන්විත වේ.

(ආ) ප්‍රධාන විධායක නිලධාරියා ...................... කළමනාකරණයට අයත්වන අතර අලෙවි කළමනාකරු .................... කළමනාකරණයට අයත් වේ.

**37.** (අ) ඉන්දු ලංකා වෙළෙඳ ගිවිසුම .............................. පාර්ශ්වීය ගිවිසුමක් ලෙස ද උතුරු ඇමරිකානු නිදහස් වෙළෙඳ ගිවිසුම (NAFTA) ........................ පාර්ශ්වීය ගිවිසුමක් ලෙස ද දැක්විය හැක.

(ආ) ISO ........................ පරිසර කළමනාකරණයට අදාළ වන අතර ISO 22000 .......................... සුරක්ෂිතතා කළමනාකරණයට අදාළ වේ.



PaperKokka.lk

**38.** (අ) තොරතුරු පද්ධතිය හා සම්බන්ධ පුද්ගලයින් ................................ ලෙස ද, ස්ථිර ලෙස උපකරණයක ගබඩා කර ඇති මෘදුකාංග ........................ ලෙස ද හැඳින්වේ.

(ආ) රැකියාවෙන් ඉවත්වීම ................................ විසින් සිදු කරන කාර්යයක් වන අතර රැකියාවෙන් පහ කිරීම................................ විසින් සිදු කෙරේ.

**39.** (අ) සංවිධානයක රැකියා පුරප්පාඩු පිරවීම .......................... සහ .......................... පුද්ගලයින් මගින් සිදු කළ හැකිය.

(ආ) සාමාන්‍ය සේවා කාලය සඳහා සේවකයන්ට කරනු ලබන ගෙවීම .................... වන අතර ඊට අමතර සේවා කාලය සඳහා කරනු ලබන ගෙවීම .......................... වේ.

**40.** (අ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයක, සැපයුම්කරුවන්ට මුදල් ගෙවීම ................. ක්‍රියාකාරකමක් වන අතර ස්ථාවර වත්කම් මිලට ගැනීම .................................... ක්‍රියාකාරකමකි.

(ආ) කොළඹ කොටස් හුවමාරුවේ පූර්ණ උප සමාගමක් වන මධ්‍යම තැන්පතු පද්ධති (පුද්ගලික) සමාගම, වෙළඳපොළ ........................ සහ ........................ මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කරයි.

- අංක **41** සිට **50** තෙක් ප්‍රශ්නවලට **සුදුසු පිළිතුරු** සපයන්න.

**41.** ව්‍යාපාර සඳහා රජයෙන් ලැබෙන සහාය සහ මඟපෙන්වීම ව්‍යාපාරිකයෙකුට වැදගත් වන ආකාර **හතරක්** දක්වන්න.

(1) ..................................................................................................

(2) ..................................................................................................

(3) ..................................................................................................

(4) ..................................................................................................

**42.** පළාත් පාලන ආයතන යටතේ පවතින ව්‍යාපාරවල ලක්ෂණ **හතරක්** ලියන්න.

(1) ..................................................................................................

(2) ..................................................................................................

(3) ..................................................................................................

(4) ..................................................................................................

**43.** ව්‍යාපාරයකට අවශ්‍ය වන ප්‍රධාන **සම්පත්** **හතරක්** නම් කරන්න.

(1) ..................................................................................................

(2) ..................................................................................................

(3) ..................................................................................................

(4) ..................................................................................................

**44.** හිමිකාරිත්වය අනුව සංස්ථාපිත හා සංස්ථාපිත නොවන ව්‍යාපාර වර්ග **දෙක** බැගින් සඳහන් කරන්න.

| සංස්ථාපිත | සංස්ථාපිත නොවන |
|---|---|
| (1) ................................................ | (1) ................................................ |
| (2) ................................................ | (2) ................................................ |

**45.** සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර, මහා පරිමාණ ව්‍යාපාරවලින් වෙන්කර හඳුනාගත හැකි සාධක **හතරක්** දක්වන්න.

(1) ..................................................................................................

(2) ..................................................................................................

(3) ..................................................................................................

(4) ..................................................................................................

[අටවැනි පිටුව බලන්න.

PaperKokka.lk

**46.** ව්‍යාපාර සඳහා භාවිත කළ හැකි පරිගණක ජාල වර්ග **හතරක්** නම් කරන්න.

(1) ..........................................................................................

(2) ..........................................................................................

(3) ..........................................................................................

(4) ..........................................................................................

**47.** පහත දී ඇති එක් එක් ප්‍රකාශය පදනම් කරගෙන ඊට අදාළව ව්‍යාපාරය කෙරෙහි උනන්දුව දක්වන පාර්ශ්වය නම් කරන්න.

| ප්‍රකාශය | උනන්දුව දක්වන පාර්ශ්වය |
|---|---|
| 1. ආයෝජනයට ලැබෙන ප්‍රතිලාභය පසුගිය වසරට වඩා ඉහළ ය. | 1. .................................... |
| 2. වෙනත් ආයතනයන්ට සාපේක්ෂව මෙම ආයතනයෙන් මිල දී ගන්නා භාණ්ඩ සඳහා ඉහළ වටිනාකමක් හිමි වේ. | 2. .................................... |
| 3. භාණ්ඩ මිල කිරීම හා අලෙවි උපක්‍රම පිළිබඳ ඉහළ අවධානයක් යොමු කිරීම වැදගත් වේ. | 3. .................................... |
| 4. මෙම ආයතනය සේවක රැකියා සුරක්ෂිතතාවය තහවුරු කර ඇත. | 4. .................................... |


**48.** පටු පාලන අවකාශය සමඟ සැසඳීමේ දී පුළුල් පාලන අවකාශයෙහි ඇති වාසි හා අවාසි දෙක බැගින් ලියන්න.

| වාසි | අවාසි |
|---|---|
| (1) .................................... | (1) .................................... |
| (2) .................................... | (2) .................................... |

**49.** විද්‍යුත් අලෙවිකරණය මගින් ව්‍යාපාරිකයාට සහ පාරිභෝගිකයාට ඇති විය හැකි අවස්ථාවක් හා තර්ජනයක් බැගින් ලියන්න.

| | ව්‍යාපාරිකයාට | පාරිභෝගිකයාට |
|---|---|---|
| අවස්ථාව | .................................... | .................................... |
| තර්ජනය | .................................... | .................................... |

**50.** පහත දී ඇති නිෂ්පාදන ජීවන චක්‍රයේ සඳහන් 1, 2, 3 සහ 4 යන අවස්ථා නම් කරන්න.




(1) ..........................................................................................

(2) ..........................................................................................

(3) ..........................................................................................

(4) ..........................................................................................

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව இலங்கைப் பரீட்சைத் திணைக்களம் Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

ව්‍යාපාර අධ්‍යයනය II
வணிகக் கல்வி II
Business Studies II

32 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස්:**

* එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න **දෙක** බැගින්වත් තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

**1.** සීමාසහිත ඔටෝ මොබයිල් සමාගම ශුන්‍ය විමෝචන (zero-emission) මෝටර් රථ එකලස් කර ශ්‍රී ලංකාව තුළ අලෙවි කරයි. සමාගම තුළ විශාල සේවක සංඛ්‍යාවක් සේවය කරන නමුත් එක් සේවකයකු නියුක්ත වන්නේ එක් කාර්යයක් සඳහා පමණි. මීට අමතරව, සමාගම විසින් පාරිභෝගිකයින් සඳහා අලෙවියෙන් පසු සේවාවන් ද සපයනු ලැබේ. තවද, සමාගම මෙම වසරේ දී වාහන අමතර කොටස් නිෂ්පාදනය ආරම්භ කරන ලදී. මෙම සමාගම වාර්ෂිකව රජයට විශාල ආදායම් බදු මුදලක් ගෙවන අතර ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධනයට ද දායක වේ.

(i) (අ) සමාගම විසින් පාරිභෝගිකයින් වෙත සපයන නිෂ්පාදිත **දෙක** නම් කර, ඒවාට උදාහරණ දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) ආර්ථිකයේ පැවැත්ම සඳහා ඉහත සමාගම දායක වී ඇති ආකාර **හතරක්** දක්වන්න. (ලකුණු 02 යි)

(ii) (අ) ඉහත සිද්ධිය ඇසුරෙන්, සමාගමේ ව්‍යාපාර කටයුතු කෙරෙහි බලපෑම් ඇතිකළ හැකි බලවේග **හතරක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ආ) ව්‍යාපාර ලාභ අරමුණු කරගත යුත්තේ ඇයි දැයි හේතු **දෙකක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(iii) (අ) අලෙවියෙන් පසු සේවාවට අමතරව මෙම සමාගම මගින් පාරිභෝගිකයන් හට සැපයිය හැකි වෙනත් සේවා **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02 යි)

(ආ) "එක් සේවකයකු නියුක්ත වන්නේ එක් කාර්යයක් සඳහා පමණි." යනුවෙන් අදහස් කරන්නේ කුමක් දැයි පැහැදිලි කර, එමගින් ව්‍යාපාරයට ලබාගත හැකි වාසි **දෙකක්** දක්වන්න. (ලකුණු 03 යි)

(iv) සමාජ වගකීම් ඉටුකිරීමෙන් මෙම සමාගමට ලබාගත හැකි ප්‍රතිලාභ **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 03 යි)

(v) පාරිසරික තිරසර සංවර්ධනය සඳහා මෝටර් රථ නිෂ්පාදකයින්ට දායක විය හැකි ආකාර **හතරක්** පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

**2.** ශාලිකා මහත්මිය ඇයගේ ඇඟලුම් නිෂ්පාදන ව්‍යාපාරය පිළිබඳව දැක්වූ අදහස් කිහිපයක් පහත වේ.

"අඩු මුදලක් ආයෝජනය කර ආරම්භ කරන ලද මගේ ව්‍යාපාරය අභියෝගාත්මක වුවත් එය පවත්වා ගැනීමේ දී සීමිත නීතිරීති ප්‍රමාණයකට පමණක් යටත් වේ. ව්‍යාපාරය පිළිබඳ සියලුම තීරණ ගැනීම මෙන් ම වගකීම් ද මා විසින් දැරිය යුතු ය. හවුල් ව්‍යාපාරයක් ලෙස මෙම ව්‍යාපාරය පරිවර්තනය කිරීමට මම අදහස් කළත් මගේ ගණකාධිකාරවරයා පැවසුවේ සීමාසහිත පුද්ගලික සමාගමක් ලෙසට ලියාපදිංචි කිරීම යෝග්‍ය බව ය."

(i) (අ) හිමිකාරිත්වය අනුව ඉහත ව්‍යාපාරය කුමන ව්‍යාපාර වර්ගයකට අයත් වන්නේ දැයි සඳහන් කරන්න. (ලකුණු 01 යි)

(ආ) ඉහත (අ) හි දක්වන ලද වර්ගීකරණය සඳහා පාදක වූ හේතු **තුනක්** සිද්ධිය ඇසුරෙන් දක්වන්න. (ලකුණු 03 යි)

[දෙවැනි පිටුව බලන්න.

PaperKokka.lk

(ii) (අ) ශාලිකා තම ව්‍යාපාරය 'වියානා ටෙක්ස්ටයිල්ස්' නමින් ලියාපදිංචි කිරීමට අදහස් කරන්නේ නම් අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය විස්තර කරන්න. (ලකුණු 02 යි)

(ආ) ශාලිකාගේ ව්‍යාපාරයට අරමුදල් සපයාගත හැකි අභ්‍යන්තර හා බාහිර මූලාශ්‍රය බැගින් නම් කර, ඒවායේ ඇති එක් වාසිය බැගින් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(iii) (අ) ශාලිකාගේ ව්‍යාපාරයේ ඇති සීමාවන් **හතරක්** දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) ශාලිකා තම නිෂ්පාදන විකිණීම සඳහා අලෙවිසැලක් ආරම්භ කිරීමට අදහස් කරන්නේ නම් එය කුමන ව්‍යාපාර සංයෝජන වර්ගයකට අයත් වන්නේ දැයි නම් කර, කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(iv) ශාලිකාගේ ව්‍යාපාරය හවුල් ව්‍යාපාරයක් ලෙස පරිවර්තනය කිරීමෙන් ඇයට හිමිවන ප්‍රතිලාභ **හතරක්** දක්වන්න. (ලකුණු 04 යි)

(v) (අ) හවුල් ව්‍යාපාරයක් හා සාපේක්ෂව සීමාසහිත පුද්ගලික සමාගමක් ලෙසින් ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමෙන් ඇතිවන වාසි **හතරක්** ලියන්න. (ලකුණු 02 යි)

(ආ) රාජ්‍ය සංස්ථාවක ඇති ලක්ෂණ **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(මුළු ලකුණු 20 යි)

3. (i) (අ) ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ප්‍රවර්ධනය සඳහා රජය විසින් දෙනු ලබන මූල්‍යමය නොවන දිරිගැන්වීම් **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) ව්‍යවසායක ප්‍රාග්ධන සමාගමක කාර්ය **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) (අ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දේශීය මුදලේ අගය ස්ථාවරව පවත්වා ගැනීමෙන් ව්‍යාපාරවලට ලැබිය හැකි වාසි **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) ප්‍රාග්ධන වෙළඳපොළෙහි ප්‍රාථමික අලෙවිකරුවන්ගේ කාර්යභාරයන් **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02 යි)

(iii) (අ) කල්බදු සමාගම් සපයන සේවාවන් තුළින් ව්‍යාපාරිකයකුට ලැබෙන වාසි **හතරක්** දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) ස්වයංක්‍රීය බැංකු සේවා මගින් ගනුදෙනුකරුවන් සඳහා අත්වන වාසි **දෙකක්** හා අවාසි **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(iv) (අ) චතුර බණ්ඩාර යන අයට ඔබ විසින් රු. 50 000 ක් චෙක්පතකින් ගෙවන්නේ නම්,

(1) උපරිම ආරක්ෂාව සැලසෙන පරිදි එය රේඛනය කරන ආකාරය පෙන්වන්න. (ලකුණු 01 යි)

(2) චෙක්පතක් අගරු වන අවස්ථා **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 01 යි)

(ආ) (1) පෙර දාතම යෙදූ චෙක්පතක් නිකුත් කිරීම සඳහා බලපාන හේතුවක් දක්වන්න. (ලකුණු 01 යි)

(2) එවැනි චෙක්පතක් සාමාන්‍ය ගිණුම් හිමියෙකුට එම දිනට පෙර බැංකුවේ තැන්පත් කළ හැකි ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න. (ලකුණු 01 යි)

(v) ආනයන තීරුබදු ඉහළ දැමීම තුළින් දේශීය ව්‍යාපාරවලට ඇතිවන වාසි **දෙකක්** හා අවාසි **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

4. (i) (අ) රජය විසින් අවම වැටුපක් නියම කිරීමෙන් සේවකයින් සඳහා ලැබෙන ප්‍රතිලාභ **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ආ) ණයවර ලිපියක් තුළින් අපනයනකරුවකුට ලැබෙන වාසි **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 02 යි)

(ii) (අ) හර පතක් සහ බැර පතක් අතර ඇති අසමානකම් **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ආ) ඩිජිටල් මුදල්වල ඇති වාසි **දෙකක්** හා අවාසි **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(iii) (අ) විද්‍යුත් වෙළෙඳාම භාවිතයෙන් භාණ්ඩයක් අලෙවි කිරීමේ දී ගතයුතු ක්‍රියාපටිපාටිය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02 යි)

(ආ) සිල්ලර වෙළෙඳාමට නව තාක්ෂණය භාවිත කළ හැකි ආකාර **දෙකක්** දක්වා, ඒ සඳහා උදාහරණය බැගින් සපයන්න. (ලකුණු 02 යි)

(iv) (අ) තොරතුරු සන්නිවේදනයේ දී කළමනාකරුවකු විසින් කාර්ය මණ්ඩලය සමඟ රැස්වීම් පැවැත්වීමෙන් ඇතිවන වාසි **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) ප්‍රධාන අරමුණු **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(v) ශ්‍රී ලංකාවේ විදේශ වෙළෙඳාම ප්‍රවර්ධනය කිරීම සඳහා යෝජනා **හතරක්** උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)



PaperKokka.lk

## II කොටස

5. කළමනාකරණය යනු 'ගතික පරිසරය තුළ ව්‍යාපාරික පරමාර්ථ සහ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සීමිත සම්පත් ඵලදායී හා කාර්යක්ෂම ලෙස භාවිත කරමින් විවිධ පුද්ගලයින් සමඟ එක්ව වැඩ කිරීමේ ක්‍රියාවලියයි.'

(i) (අ) ඉහත නිර්වචනය තුළ අන්තර්ගත කළමනාකරණ සංකල්ප **හතරක්** දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) ව්‍යාපාරයක පරමාර්ථ සහ අරමුණු අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(ii) (අ) ඉදිරි පෙළ කළමනාකරුවන් සඳහා තාක්ෂණික කුසලතා වඩාත් වැදගත් වන්නේ ඇයි දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(ආ) පහළ කළමනාකරුවන් වෙත බලතල පැවරීමෙන් ආයතනයේ කළමනාකරණයට ලබාගත හැකි ප්‍රතිලාභ **හතරක්** දක්වන්න. (ලකුණු 02 යි)

(iii) (අ) සඵලදායී සැලසුම්කරණය ව්‍යාපාරයකට වැදගත් වන ආකාර **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 02 යි)

(ආ) කළමනාකරුවකුට බලය ලැබෙන මූලාශ්‍ර **හතරක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(iv) තිලක්ෂිගේ ව්‍යාපාරය හා සම්බන්ධව පහත තොරතුරු දී ඇත.

- උපරිම ද්‍රව්‍ය පරිභෝජනය - දිනකට ඒකක 200යි.
- අවම ද්‍රව්‍ය පරිභෝජනය - දිනකට ඒකක 120යි.
- යළි ඇණවුම් කිරීමේ කාලය - අවමය දින 10 ක් හා උපරිමය දින12කි.
- යළි ඇණවුම් ප්‍රමාණය - ඒකක 1600 කි.

පහත දෑ ගණනය කරන්න.

(අ) යළි ඇණවුම් මට්ටම

(ආ) අවම තොග මට්ටම

(ඉ) උපරිම තොග මට්ටම

(ඊ) සාමාන්‍ය තොගය (ලකුණු 04 යි)

(v) වෙළෙඳපොළේ ඇති පරිගණක වර්ග පහක් ඇසුරෙන් එක් පරිගණකයක් මිලදී ගැනීම සඳහා කළමනාකරුවකු ලෙස ඔබගේ තීරණගැනීමේ ක්‍රියාවලිය උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

6. (i) (අ) නිෂ්පාදන ක්‍රමයක් තෝරාගැනීමේ දී අවධානය යොමුකළ යුතු නිර්ණායක **හතරක්** දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) ප්‍රවාහ නිෂ්පාදන ක්‍රමයේ දී පරිගණක ආධාරක නිෂ්පාදන ක්‍රමය (CMA) යෝග්‍ය වීමට හේතු **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) (අ) 'ශ්‍රම ඵලදායීතාව' යන්න නිර්වචනය කර, එය වර්ධනය කර ගැනීමට සංවිධානයකට යොදාගත හැකි ක්‍රමවේද **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) නිෂ්පාදකයකු විසින් භාණ්ඩ නිෂ්පාදනයේ දී සැලකිය යුතු ආචාරධර්ම **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 02 යි)

(iii) (අ) සඵලදායී සන්නිවේදනය මගින් ව්‍යාපාරයකට ලබාගත හැකි ප්‍රතිලාභ **හතරක්** දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) විද්‍යුත් සන්නිවේදනයේ ඇති සීමා **හතරක්** ලියන්න. (ලකුණු 02 යි)

(iv) (අ) මින්ට්ස්බර්ග්ගේ කළමනාකරණ තීරණ භූමිකාව අනුව කළමනාකරුවකු ව්‍යවසායකයකු ලෙස සලකන්නේ ඇයි? (ලකුණු 01 යි)

(ආ) අභිප්‍රේරණය තුළින් සංවිධානයකට සහ සේවකයන්ට ලැබෙන ප්‍රතිලාභ **තුන** බැගින් දක්වන්න. (ලකුණු 03 යි)

(v) හරිත ව්‍යවසායකයින් ආර්ථිකයට වැදගත් වන ආකාරය උදාහරණ **දෙකක්** සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

PaperKokka.lk

7. සබන් නිෂ්පාදනායතනයක් තම නිෂ්පාදන විවිධ පාරිභෝගික කණ්ඩායම් අනුව වෙනස් වෙළඳ නාම යටතේ නිෂ්පාදනය කර අලෙවි කරනු ලැබේ. නව නිෂ්පාදනයක් හඳුන්වා දීමට ප්‍රථම මෙම ආයතනය වෙළඳපොළ පර්යේෂණ සිදු කරයි.

(i) (අ) විවිධ පාරිභෝගික කණ්ඩායම් සඳහා මෙම ආයතනය තම නිෂ්පාදන සිදු කරන්නේ ඇයි දැයි විස්තර කරන්න. (ලකුණු 02 යි)

(ආ) මෙම ආයතනය යොදාගනු ලබන්නේ ගනුදෙනුකරු සංකල්පය ද නැතහොත් විකුණුම් සංකල්පය ද යන්න හේතු සහිතව දක්වන්න. (ලකුණු 02 යි)

(ii) (අ) මෙම භාණ්ඩය කුමන පාරිභෝගික භාණ්ඩ වර්ගයට අයත් වන්නේ ද? (ලකුණු 01 යි)

(ආ) නව නිෂ්පාදන හඳුන්වාදීමට ප්‍රථම වෙළෙඳපොළ පර්යේෂණ තුළින් ආයතනයකට ලබාගත හැකි වාසි **තුනක්** විස්තර කරන්න. (ලකුණු 03 යි)

(iii) භාණ්ඩයක් එහි ජීවන චක්‍රයේ පරිණත අදියරට පැමිණි පසු එය දීර්ඝ කර ගැනීම සඳහා යොදා ගත හැකි උපායමාර්ග **හතරක්** ලියන්න. (ලකුණු 04 යි)

(iv) (අ) මුදල් අයවැය ලේඛනයක් පිළියෙල කිරීමෙන් ව්‍යාපාරයකට ලැබෙන ප්‍රතිලාභ **හතරක්** දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) ප්‍රාග්ධන ආයෝජන තීරණ සඳහා නිදසුන් **හතරක්** ලියන්න. (ලකුණු 02 යි)

(v) (අ) 'ක්‍රියාකාරී අනුපාත' යනු කුමක් දැයි දක්වා, එහි ඇති වාසි **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ආ) 'අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළෙඳපොළ' යනුවෙන් අදහස් කරන්නේ කුමක් දැයි පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(මුළු ලකුණු 20 යි)

8. (i) (අ) සේවකයින් බාහිරව බඳවා ගැනීමෙන් සංවිධානයකට ලැබෙන වාසි **හතරක්** දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) 'රැකියාස්ථ පුහුණුව' මගින් ඇතිවිය හැකි අවාසි **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(ii) (අ) කාර්ය සාධන ඇගයීම සංවිධානයකට කෙසේ වැදගත් වන්නේ දැයි ආකාර **දෙකක්** මගින් විස්තර කරන්න. (ලකුණු 02 යි)

(ආ) වඩාත් ම සුදුසු රැකියා අපේක්ෂකයා තෝරා ගැනීම සඳහා සංවිධානයකට යොදාගත හැකි ක්‍රමවේද **දෙකක්** උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(iii) (අ) ඵලදායී තොරතුරු පද්ධතියක කාර්ය **හතරක්** දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) අන්තර්ජාලය මගින් තොරතුරු හුවමාරුව සිදු කිරීමේ දී ව්‍යාපාරයකට ඇතිවන **වාසි දෙකක්** සහ අවාසි **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(iv) (අ) ව්‍යාපාර සැලැස්මක වැදගත්කම පිළිබිඹු වන හේතු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 01 යි)

(ආ) ව්‍යාපාර සැලැස්මක් සැකසීමට අවශ්‍ය වන අවස්ථා **තුනක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03 යි)

(v) නිෂ්පාදනයක මුළු පිරිවැය රුපියල් මිලියන 25 ක් වන අතර ඉන් රුපියල් මිලියන 15 ක් ස්ථාවර පිරිවැය වේ. ව්‍යාපාරයේ මුළු ආදායම රුපියල් මිලියන 20 කි. අලෙවි පුරෝකථන මගින් අනාගතයේ දී මෙම නිෂ්පාදනයට ඉහළ ඉල්ලුමක් ඇතිවිය හැකි බවට වාර්තා කර ඇත. ආයතනයේ නිෂ්පාදන කළමනාකරු විසින් නිෂ්පාදනය නතර කළ යුතු යැයි යෝජනා කළ නමුත් අලෙවි කළමනාකරු විසින් එය අඛණ්ඩව සිදු කළ යුතු බවට යෝජනා කරන ලදී. නිෂ්පාදනය අඛණ්ඩව සිදු කළ යුතු ද නැතහොත් නතර කළ යුතු ද යන්න පිළිබඳව ඔබගේ තීරණය දක්වා, එම පිළිතුරට හේතු **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

***

PaperKokka.lk